**ලංසු කැඳවීමයි**

**සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**

# ලංසු අංකය : 066/T/2022

## පිදුරුතලාගල රේඩාර් සහ සන්නිවේදන මධ්‍යස්ථානයේ VHF ගගන-භූමි සන්නිවේදන පද්ධතිය සැපයීම, සවිකිරීම හා බලාත්මක කිරීම සඳහා ලංසු කැඳවීම

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සභාපති විසින් **පිදුරුතලාගල රේඩාර් සහ සන්නිවේදන මධ්‍යස්ථානයේ VHF ගගන-භූමි සන්නිවේදන පද්ධතිය සැපයීම, සවිකිරීම හා බලාත්මක කිරීම** සඳහා ලංසු කැඳවනු ලැබේ.

ලංසු ලිපි ලේඛන කට්ටලයක් **ආපසු නොගෙවනු ලබන රුපියල් විසි දහසක** (රු. 20,000.00) මුදලක් සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික ) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දාම කළමනාකරණ අංශයට ගෙවීමෙන් ලබාගත හැකි අතර ඒ සඳහා ලංසු තබන්නා විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිනම් www.airport.lk වෙබ් අඩවියේ පළ කර ඇති බාගත කිරීම මඟින් ද (ඇමෙරිකානු ඩොලර් 50.00 ක මාගර්ගත ගෙවීමක් හරහා) මෙම ලංසු ලිපිය ලබාගත හැක.

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දාම කළමනාකරණ අංශය වෙතින් 2024.02.06 වන දින සිට 2024.03.26 වන දින දක්වා ඕනෑම වැඩකරන දිනයකදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු ලිපි ලේඛන කට්ටල ලබාගත හැකිය. අවශ්‍ය නම් ඉහත ලංසු ලිපි ලේඛන සැපයුම් දාම කළමනාකරණ අංශ කායර්ාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

ලංසු තබන්නන් ඔවුන්ගේ ලංසු කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පිහිටි සැපයුම් දාම කළමනාකරණ අංශයේ තබා ඇති ලංසු බහාලුම් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. තවද, ලංසු තබන්නන්ගේ කැමැත්ත පරිදි ඔවුන්ගේ සීල් තබන ලද ලංසු ඉහත ලිපිනයට පෞද්ගලිකවද ගෙනවිත් බාරදිය හැකිය.

ලංසු තැබීම 2024 **මාර්තු** 27 වන බදාදා දින **ප.ව.** 2.00 ට අවසන් වන අතර අදාල ලංසු විවෘත කිරීම ඒ සමඟම සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දාම කළමනාකරණ අංශයේදී සිදුකෙරේ. ලංසු තබන්නන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවේදී එයට සහභාගි විය හැකිය.

ලංසු සුරැකුම් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක, මහ බැංකුවේ අනුමැතිය ලත් බැංකුවකින් සභාපති, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම වෙත ඉල්ලුම මත ගෙවෙන සේ නිකුත් කරන **රුපියල් ලක්ෂ විසි හතක** (රු. 2,700,000.00) වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක්, ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.

ලංසු තැබීමට අදාල විස්තර පැහැදිලි කිරීම 2024.02.20 වන දින පෙ.ව. 10.00 ට පිදුරුතලාගල රේඩාර් හා සන්නිවේදන මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබේ. ඒ සඳහා එක් ලංසු තබන්නෙක් වෙනුවෙන් උපරිම වශයෙන් (03) තිදෙනෙකුට සහභාගි විය හැකි අතර, ඒ සඳහා පැමිණෙන අයගේ විස්තර (නම/ජා.හැ. අංකය/වාහන අංකය) ලංසු විස්තර කිරීමේ දිනයට **දින 7 කට පෙර** දැනුම් දිය යුතුය.

මේ පිළිබඳ වැඩි විස්තර, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) පුද්ගලික සමාගමේ සැපයුම් දාම කළමනාකරණ අංශයේ දුරකථන අංකය 011-2264103/ 011-2264128 ඇමතීමෙන්, head.scm@airport.lk විද්‍යුත් ලිපිනයෙන් හෝ අපගේ www.airport.lk යන අන්තජර්ාල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

**සභාපති,**
**සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ,**
**කටුනායක.**